# කෘෂි තාක්ෂණ තොරතුරු

කෘෂි තාක්ෂණ තොරතුරු කඩිනමින් ගොවි ජනතාව අතරට ලබාදීමේ අත්වැලකි

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂි තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි

NAICC

තාක්ෂණික පත්‍රිකා අංක 13 - 2019 මැයි

## කාලගුණ අනාවැකිය

### නිරිතතදිග මෝසම් වර්ෂාපතනය (මැයි - ජූලි) 2019 යල කන්නය

දැනට ආරම්භ වී ඇති 2019 යල කන්නය තුළදී ශ්‍රී ලංකාවේ තෙත් කලාපය හා ඊට යාබදව පිහිටි අතරමැදි කලාපයට අයත් ප්‍රදේශයන්ට සාමාන්‍ය හෝ සාමාන්‍ය අගයකට ආසන්න වර්ෂාපතනයක් ලැබිය හැකි බවට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව අනාවැකි පළකර සිටී. ගෝලීය දේශගුණ ආකෘතීන් හරහා කළ ගැඹුරු අධ්‍යයනයකින් පසු මැයි-ජූලි කාලය තුළදී ලැබීමට නියමිත නිරිතදිග මෝසම් වැසි සම්බන්ධයෙන් ඔවුන් මේ අනාවරණය සිදුකර ඇත.

එසේවුවද ඉන්දීය කාලගුණ දෙපාර්තමේන්තුව පැසිෆික් සාගරයේ මධ්‍යම හා නැගෙනහිර ප්‍රදේශවල ඇතිවී තිබෙන තරමක් දුර්වල වූ **"එල්නිනෝ"** ආකාරයේ වායුගෝලීය සංසරණය ද සැළකිල්ලට ගනිමින් එලඹෙන නිරිතදිග මෝසම ගැන දක්වා ඇති කරුණු ද සළකා බැලීම වැදගත් වේ. එම අනාවැකියට අනුව සාමාන්‍යයෙන් කේරල ප්‍රාන්තයේ වෙරළ තීරයට නිරිතදිග මෝසම් වැසි ආරම්භය ජූනි මස පළමුවනදා සිදුවීමට නියමිත වුවද, මෙවර එම දිනය සතියකින් පමණ ප්‍රමාද වනු ඇත. ශ්‍රී ලංකාවට නිරිතදිග මෝසම් වැසි ආරම්භය සාමාන්‍යයෙන් සිදුවන්නේ මැයි මස 25 වනදා හෝ ඊට ආසන්න දිනයක වන අතර ඉහත සඳහන් කළ දුර්වල එල්නිනෝ තත්වය නිසා ශ්‍රී ලංකාවේ නිරිතදිග මෝසම් සම්ප්‍රාප්තිය බොහෝවිට දින 5 සිට 7 කින් ප්‍රමාදවීමට හැකියාවක් ඇත.

සාමාන්‍යයෙන් නිරිතදිග මෝසම් සමයේ සැළකිය යුතු වර්ෂාපතනයක් නොලැබෙන ශ්‍රී ලංකාවේ වියළි කලාපය හා ඊට යාබද වියළි අතරමැදි කලාපය බොහෝදුරට සාමාන්‍ය අගයට වඩා වැඩි වර්ෂාපතනයක් ලැබිය හැකි බවට ද කාලගුණ දෙපාර්තමේන්තුව තවදුරටත් අනාවැකි පළ කරයි. එනමුත් සාමාන්‍යයෙන් මැයි සිට ජූලි මස දක්වා එම කලාප වලට ලැබෙන සාමාන්‍ය වර්ෂාපතනය ද ඉතා අඩු අගයක් ගන්නා බැවින් සහ එම කලාප වලට බලපවත්වන අධික වාෂ්පීකරණ තත්වය සැළකිල්ලට ගනු ලැබූ කළ සාමාන්‍ය අගයෙන් තරමක් ඉහළ අගයක වර්ෂාපතනයක් ලැබීම කෘෂිකාර්මික කටයුතු සාර්ථක කරගැනීමෙහි ලා සැහීමකට පත්විය හැකි තත්වය නොවනු ඇත. එබැවින් මෙම කලාපයන් හි සිදු කරන සියලු කෘෂිකාර්මික කටයුතු හා වාරි සැලසුම් ඇතුළු අනෙකුත් කෘෂිකර්මාන්තයට සම්බන්ධ තීරණ ගැනීමේ දී ඒ ඒ කලාප වලට අදාළ සාමාන්විත කාලගුණ දත්ත සැළකිල්ලට ගැනීම ප්‍රඥාගෝචරය.

වියළි හා අතරමැදි කලාපයන්ට අදාළව ගණනය කළ මාසික මුළු වර්ෂාපතන දත්ත හා වාෂ්පීකරණයෙන් සිදුවන ජල හානියේ විභවයන්, මේ සමග පහතින් ඉදිරිපත් කර ඇත්තේ වඩාත් සාර්ථක තීරණ වලට එළඹීම පහසුවනු පිණිසය.

**වගුව 1 : වියළි හා වියළි අතරමැදි කලාපයන්හි අපේක්ෂිත මාසික වර්ෂාපතනය හා වාෂ්පීකරණ විභවයන් - මැයි 2019**

| කෘෂි පාරිසරික කලාපය | අපේක්ෂිත මාසික වර්ෂාපතනය (මි.මී) | අපේක්ෂිත මාසික වාෂ්පීකරණ විභවය (මි.මී) |
|---|---|---|
| **IU1** | 81.4 | 88.04 |
| **IU2** | 84.1 | 78.74 |
| **IU3a** | 94.2 | 75.02 |
| **IU3b** | 84.6 | 73.78 |
| **IU3c** | 78.0 | 77.81 |
| **IU3d** | 95.8 | 71.30 |
| **IU3e** | 70.6 | 72.54 |
| **IM1a** | 67.3 | 82.77 |
| **IM1b** | 42.0 | 98.27 |
| **IM1c** | 34.5 | 83.39 |
| **IM2a** | 121.4 | 87.73 |
| **IM2b** | 78.4 | 89.28 |
| **IM3a** | 82.9 | 85.25 |
| **IM3b** | 46.7 | 101.68 |
| **IM3c** | 55.0 | 79.36 |
| **IL1a** | 104.0 | 94.55 |
| **IL1b** | 88.5 | 104.16 |
| **IL1c** | 62.9 | 102.92 |
| **IL2** | 40.0 | 107.26 |
| **IL3** | 60.7 | 117.80 |
| **DL1a** | 44.5 | 95.17 |
| **DL1b** | 31.8 | 112.53 |
| **DL1c** | 27.1 | 128.65 |
| **DL1d** | 17.5 | 127.10 |
| **DL1e** | 24.3 | 123.69 |
| **DL1f** | 27.5 | 117.18 |
| **DL2a** | 29.5 | 116.56 |
| **DL2b** | 14.5 | 127.72 |
| **DL3** | 18.5 | 125.24 |
| **DL4** | 13.7 | 127.72 |
| **DL5** | 21.0 | 115.94 |

**වගුව 2 : වියළි හා වියළි අතරමැදි කලාපයන්හි අපේක්ෂිත මාසික වර්ෂාපතනය හා වාෂ්පීකරණ විභවයන් - ජූනි 2019**

| කෘෂි පාරිසරික කලාපය | අපේක්ෂිත මාසික වර්ෂාපතනය (මි.මී) | අපේක්ෂිත මාසික වාෂ්පීකරණ විභවය (මි.මී) |
|---|---|---|
| **IU1** | 83.1 | 78.00 |
| **IU2** | 51.1 | 73.20 |
| **IU3a** | 16.5 | 82.20 |
| **IU3b** | 22.8 | 72.60 |
| **IU3c** | 11.7 | 77.70 |
| **IU3d** | 12.6 | 62.40 |
| **IU3e** | 17.3 | 73.50 |
| **IM1a** | 19.4 | 81.00 |
| **IM1b** | 27.7 | 93.30 |
| **IM1c** | 5.6 | 82.20 |
| **IM2a** | 77.8 | 84.30 |
| **IM2b** | 16.2 | 90.60 |
| **IM3a** | 92.9 | 69.00 |
| **IM3b** | 39.0 | 94.20 |
| **IM3c** | 50.1 | 72.90 |
| **IL1a** | 65.8 | 84.00 |
| **IL1b** | 52.4 | 97.50 |
| **IL1c** | 12.9 | 107.10 |
| **IL2** | 5.7 | 114.00 |
| **IL3** | 18.5 | 99.90 |
| **DL1a** | 4.9 | 99.00 |
| **DL1b** | 3.1 | 114.60 |
| **DL1c** | 1.1 | 135.60 |
| **DL1d** | 0.1 | 132.90 |
| **DL1e** | 0.0 | 129.00 |
| **DL1f** | 0.4 | 118.80 |
| **DL2a** | 3.5 | 130.80 |
| **DL2b** | 30.2 | 139.50 |
| **DL3** | 0.7 | 128.70 |
| **DL4** | 0.0 | 133.50 |
| **DL5** | 28.6 | 129.90 |

වගුව 3 : වියළි හා වියළි අතරමැදි කලාපයන්හි අපේක්ෂිත මාසික වර්ෂාපතනය හා වාෂ්පීකරණ විභවයන් - ජූලි 2019

| කෘෂි පාරිසරික කලාපය | අපේක්ෂිත මාසික වර්ෂාපතනය (මි.මී) | අපේක්ෂිත මාසික වාෂ්පීකරණ විභවය (මි.මී) |
|---|---|---|
| IU1 | 73.3 | 85.56 |
| IU2 | 54.1 | 74.40 |
| IU3a | 26.0 | 84.01 |
| IU3b | 20.0 | 73.47 |
| IU3c | 30.0 | 79.36 |
| IU3d | 31.6 | 62.00 |
| IU3e | 22.0 | 74.40 |
| IM1a | 27.3 | 83.39 |
| IM1b | 19.4 | 100.75 |
| IM1c | 5.7 | 86.80 |
| IM2a | 55.3 | 89.28 |
| IM2b | 23.0 | 91.14 |
| IM3a | 87.8 | 77.19 |
| IM3b | 27.1 | 104.47 |
| IM3c | 42.7 | 75.64 |
| IL1a | 36.1 | 93.00 |
| IL1b | 32.3 | 108.81 |
| IL1c | 18.7 | 105.71 |
| IL2 | 16.7 | 119.04 |
| IL3 | 10.3 | 110.98 |
| DL1a | 6.4 | 101.37 |
| DL1b | 3.4 | 122.76 |
| DL1c | 5.8 | 144.15 |
| DL1d | 5.0 | 139.19 |
| DL1e | 6.7 | 133.61 |
| DL1f | 0.3 | 124.93 |
| DL2a | 15.4 | 128.96 |
| DL2b | 9.2 | 145.08 |
| DL3 | 1.9 | 130.20 |
| DL4 | 0.4 | 132.37 |
| DL5 | 3.5 | 137.02 |

වගුව 4 : වියළි හා වියළි අතරමැදි කලාපයන්හි අපේක්ෂිත මාසික වර්ෂාපතනය හා වාෂ්පීකරණ විභවයන් - අගෝස්තු

| කෘෂි පාරිසරික කලාපය | අපේක්ෂිත මාසික වර්ෂාපතනය (මි.මී) | අපේක්ෂිත මාසික වාෂ්පීකරණ විභවය (මි.මී) |
|---|---|---|
| IU1 | 69.1 | 85.87 |
| IU2 | 56.5 | 75.33 |
| IU3a | 32.3 | 84.94 |
| IU3b | 29.6 | 73.47 |
| IU3c | 41.2 | 79.67 |
| IU3d | 31.6 | 62.00 |
| IU3e | 32.5 | 74.71 |
| IM1a | 37.3 | 84.32 |
| IM1b | 21.6 | 103.85 |
| IM1c | 6.2 | 87.73 |
| IM2a | 59.4 | 88.35 |
| IM2b | 35.9 | 95.79 |
| IM3a | 68.5 | 76.57 |
| IM3b | 19.2 | 107.57 |
| IM3c | 37.2 | 76.26 |
| IL1a | 29.7 | 94.55 |
| IL1b | 30.7 | 109.43 |
| IL1c | 29.0 | 115.01 |
| IL2 | 29.5 | 121.83 |
| IL3 | 8.3 | 115.94 |
| DL1a | 7.5 | 106.64 |
| DL1b | 4.4 | 128.03 |
| DL1c | 17.0 | 149.42 |
| DL1d | 23.6 | 143.84 |
| DL1e | 16.2 | 136.09 |
| DL1f | 2.8 | 127.41 |
| DL2a | 25.6 | 134.23 |
| DL2b | 14.1 | 148.80 |
| DL3 | 4.3 | 132.06 |
| DL4 | 1.6 | 130.82 |
| DL5 | 4.9 | 147.25 |

ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් 2019 අප්‍රේල් 08 වෙනි දින නිකුත් කරන ලද කෘෂි දේශගුණික උපදේශය මත පිහිටා කටයුතු කිරීම නැවතත් සිහිපත් කරන අතර, ඒ තුළින් භූමියේ හා ජල සම්පතෙහි උපරිම ඵලදායිතාවයක් ලබාගනු ඇතැයි බලාපොරොත්තු තබන්නෙමු.

කාලගුණ තත්වයන්ගේ මෙවැනි යාවත්කාලීන තොරතුරු ඉදිරි යල කන්නය පුරාම කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ උපදෙස් මතද, වෙනත් ජාත්‍යන්තර කාලගුණ විද්‍යා ආයතනයන්ගේ තොරතුරු පරිශීලකයන්ගෙන් ද ලබාදීමට ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය පියවර ගනිමින් සිටී.

**තාක්ෂණික කරුණු : බී.වී.ආර් පුණ්‍යවර්ධන (ප්‍රධාන විද්‍යාඥ/ප්‍රධානී, කෘෂි කාලගුණ හා දේශගුණ විපර්සාය අංශය)**

**ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය, පේරාදෙණිය**

පරිගණක නිර්මාණය : ගෝතමී ලියනගේ

අධීක්ෂණය හා උපදෙස් : එස්. පෙරියසාමි (අධ්‍යක්ෂ - තොරතුරු හා සන්නිවේදන), අයි.එස්.එම් හලීම්දීන් (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ)